**යාපනය විශ්වවිද්‍යාලය - 2021**

**----------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 තත්වාගණනය කළ මතය

----------------------------

යාපනය විශ්වවිද්‍යාලයේ ("විශ්වවිද්‍යාලය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 වන ඡේදය ප්‍රකාරව, ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. දේපල, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණු පිරිවැය රු.78,957,863 ක් වූ වාහන හා උපාධි ලෝගු සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතා කරමින් පැවතුණි. එමෙන්ම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ට අනුකූලව ඉහත ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීමටද පියවර ගෙන නොතිබුණි. | සම්බන්ධිත වත්කම් අයිතම සංඛ්‍යාව, දැරීමට සිදුවන පිරිවැය හා ගතවන කාලය පිළිබඳ සැලකිලිමත්ව සහ පාලක මණ්ඩලයේ නිර්දේශ හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය මත, ක්ෂය ප්‍රතිපත්තිය සරල රේඛීය ක්‍රමයෙන් හීනවන ශේෂ ක්‍රමයට වෙනස් කිරීමටත්, පිරිවැය ආකෘතියක් අනුගමනය කිරීමේ ප්‍රතිපත්තියක් ආරම්භ කිරීමටත් පියවර ගැනේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රත්‍යාගණනය කළ වත්කමක සාධාරණ වටිනාකම ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට තවත් ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය වේ. සෑම වසර 03 කට හෝ 05 කට වරක් අයිතමය නැවත ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය විය හැකිය. කෙසේ වුවද, මුළු මුදල රු.7,288,976,743 ක් වූ දේපල, පිරියත හා උපකරණ 2014 වර්ෂයේ සිට පසුගිය වසර 7 තුළ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | සම්බන්ධිත වත්කම් අයිතම සංඛ්‍යාව, දැරීමට සිදුවන පිරිවැය හා ගතවන කාලය පිළිබඳ සැලකිලිමත්ව සහ පාලක මණ්ඩලයේ නිර්දේශ හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය මත, ක්ෂය ප්‍රතිපත්තිය සරල රේඛීය ක්‍රමයෙන් හීනවන ශේෂ ක්‍රමයට වෙනස් කිරීමටත්, පිරිවැය ආකෘතියක් අනුගමනය කිරීමේ ප්‍රතිපත්තියක් ආරම්භ කිරීමටත් පියවර ගැනේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂවලදී ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA) හා උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම හා සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිවලින් ලැබී තිබුණු පිරිවැය රු.2,421,636,621 ක වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව අතීතානුයෝගීව ගැලපීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී විනිමය නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 හා 11 ට අනුව, විනිමය හා විනිමය නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම එම වර්ෂයේ ආදායමක් ලෙස පමණක් හෙළිදරව් කළ යුතුවේ. එහෙත්, ගොඩනැගිලි ඉදිකිරීම් හා භාණ්ඩ ලැබීම් 2021 වර්ෂයට පෙර අවසන්ව තිබුණද, එම වත්කම් නිල වශයෙන් පැවරීම සිදු කරන්නේ 2021 වර්ෂය තුළදීය. මේ නිසා ඉහත ප්‍රමිති අනුව මෙම ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 ට අනුව, එකතුව රු.2,541,450 ක් වූ පශු සම්පත් ශේෂයක්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වෙනම අයිතමයක් ලෙස දැක්වීම වෙනුවට දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, දේපළ, පිරියත හා උපකරණ ශේෂය ඊට සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී පශු සම්පත් ශේෂය, ජංගම නොවන වත්කම්වල වෙනම අයිතමයක් ලෙස හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.40,972,090 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 අනුව ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය ඊට සමාන ප්‍රමාණයකින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | කළමනාකාරිත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල විය යුතුය. |

1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
------------------------------------

1.6.1 ලැබිය යුතු ගිණුම්
--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 03ත් වර්ෂ 26 ත් අතර කාලයක් පැරණි ආපදා ණය රු.1,168,318 ක් අයකර ගැනීමට නිසි පියවර ගෙන නොතිබුණි. | මෙම ණය ශේෂය අදාළ සේවකයාගේ පාරිතෝෂික දීමනාවෙන් නොපමාව අයකර ගැනීමට පියවර ගෙන ඇත. | ගෙවිය යුතු මුදල් නියමිත කාලයට අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

1.6.2 ගෙවිය යුතු ගිණුම්
--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්වයං මූල්‍ය පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් ඇම්සර්ඩෑම් විශ්ව විද්‍යාලයේ රීකෝප් මත්ස්‍ය ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු රු.1,591,323 ක් වර්ෂ 01 ත් වර්ෂ 05 ත් අතර කාලයක් උපයෝජනය නොකර ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | මෙම අරමුදල් භාවිතා කළ හැකි වන්නේ අදාළ නිර්නායක සම්පූර්ණ කළ විට පමණි. ඉල්ලීම් කළ විට ගෙවිය යුතු වන බැවින් මෙම අරමුදල් ශේෂය ජංගම වගකීම් යටතේ තබාගත යුතුවේ. | නිරවුල් නොවූ ශේෂ, උපයෝජනය සඳහා සුදුසු පියවරගත යුතුය. |

## 1.7 නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 267 | 2021 ජනවාරි, පෙබරවාරි හා නොවැම්බර් යන මාස 03 හි අවස්ථා 45 කදී, මුදල් ලද බවට තහවුරු කිරීමක් ලබා නොගෙන සේවකයින්ට වැටුප් ගෙවා තිබුණි. එමෙන්ම, සමාලෝචිත වර්ෂය තුළදී වෙනත් අයෙකු විසින් සිය අත්සන යොදා වැටුප්ලාභියාට හිමි වැටුප ලබාගත් අවස්ථා 173 ක් පැවති බව අනාවරණය විය. | | |
| (ii) මුදල් රෙගුලාසි 371(2) | ❖ අවස්ථා 270 ක දී සේවකයින් වෙත නිකුත් කර තිබුණු එකතුව රු.7,270,301 ක් වූ අතුරු අග්‍රිම දින 11ත් දින 161 ත් අතර ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. | මේ සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ග ගෙන ඇති අතර නියමිත කාලය තුළදී අග්‍රිම පියවීම සම්බන්ධයෙන් සියලු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා අභ්‍යන්තර මූල්‍ය චක්‍රලේඛ නිකුත් කර ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| | ❖ එකතුව රු.3,147,017ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 20 ක් නිකුත් කිරීම සඳහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. | කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා දැනටමත් අභ්‍යන්තර මූල්‍ය චක්‍රලේඛයක් නිකුත් කර ඇත. මෙම ගනුදෙනු දැඩි ව අධීක්ෂණය හා හැසිරවීම සඳහා නිසි යාන්ත්‍රණයක් දැනටමත් ක්‍රියාත්මක කර ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන අත් පොත (භාණ්ඩ හා සේවා) 5.3.11 වගන්තිය | ඇමතුම් මගින් වාහන ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී තෝරාගත් ලංසුකරුවන් දෙදෙනෙකුගෙන් ලංසු සුරක්ෂණ ලබාගෙන නොතිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය පාදක කරගෙන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සුදුසු කොන්ත්‍රාත්කරුවන් වෙත ඇමතුම් වාහන සඳහා වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | ප්‍රසම්පාදන අත්පොතට අනුකූල විය යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,250,028,585ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාව රු. 966,484,640ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,216,513,225ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන හා විනිමය නොවන ගනුදෙනුවලින් ලද මූලධන ආදායම් වැඩි වීම හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා විදේශගත වූ විශ්ව විද්‍යාලීය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 69 දෙනෙකු සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 21 දෙනෙකු නැවත රාජකාරියට වාර්තා කර හෝ ශිෂ්‍යත්ව නිම කර විශ්ව විද්‍යාලයෙන් පිටව ගොස් හෝ නොතිබුණි. එහෙත්, 1983 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ එලෙස ගිවිසුම් කඩකළ නිලධාරීන්ගෙන් එකතුව රු.71,019,495ක් වූ බැඳුම්කර අයකර ගැනීමට විශ්ව විද්‍යාලය විසින් නිසි පියවර ගෙන නොතිබුණි. | සිද්ධියෙන් සිද්ධියට විස්තරාත්මක අධ්‍යයනයක් සිදුකර, ගතහැකි නීතිමය ක්‍රියා මාර්ග සඳහා පාලක මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරන ලෙස සහකාර ලේඛකාධිකාරී (නීති හා ප්‍රලේඛන) මගින් ඉල්ලා සිටින ලදී. විශ්ව විද්‍යාලය විසින් අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පාරිතෝෂික සහ විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල් මේ දක්වාම නිදහස් කර නොමැති අතර එම අරමුදල් විශ්ව විද්‍යාලය සතුව පවතී. ඔවුන් අර්ථසාධක අරමුදල සඳහා හිමිකම් කියන අවස්ථාවේදී හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගනු ලැබේ. | වගකිව යුතු නිලධාරීන්ගෙන් අදාළ බැඳුම්කර අයකර ගැනීම සඳහා නොපමාව පියවර ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියකට 2018 දෙසැම්බර් 26 දින සිට බලපැවැත්වෙන පරිදි සිය තනතුරෙන් ඉල්ලා අස්වීම සඳහා අනුමැතිය ලැබී තිබුණි. ඇය සිය ඉල්ලා අස්වීම ඉවත් කර ගෙන තිබුණු අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 4.5(ඇ) වගන්තියට පටහැනි පසුව නැවත සේවයේ පිහිටුවා තිබුණි. කෙසේ වෙතත්, නැවත සේවයේ පිහිටුවීමෙන් පසු විශ්ව විද්‍යාලයෙන් කිසිදු අඛණ්ඩ සේවාවක් ලබා නොගෙන වැටුප් හා දීමනා ලෙස රු.12,451,000ක් ඇය වෙත ගෙවා තිබුණි. එමෙන්ම, ඇය නිසි පරිදි සිය තනතුරෙන් ඉල්ලා අස්වී තිබුණද, නැවත සේවයේ පිහිටුවන ලද දින සිට පිළිවෙලින් අවුරුදු 07ක් හා අවුරුදු 06ක් සම්පූර්ණ නොවී සප්ත වාර්ෂික නිවාඩු හා වාහන ආනයන බලපත්‍රය ලබාදී තිබුණි. | ඇයගේ සේවය ඛණ්ඩනයවී නොතිබුණි. එබැවින්, ඇයගේ සප්ත වාර්ෂික නිවාඩු සඳහා ඇති අයිතිය පිළිබඳ සලකා බලා එම නිවාඩු ලබා දෙන ලදී. ඉහත සඳහන් නිර්දෝෂභාවය මත පදනම්ව වාහන බලපත්‍ර හා අනෙකුත් ප්‍රතිලාභද ඇයට ලබාදී තිබුණි. | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන සංග්‍රහයට අනුකූල විය යුතුය. |
| (ඇ) | අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් 07 දෙනෙකුට විශේෂ අධ්‍යයන නිවාඩු කාලය තුළ සිය පශ්චාත් උපාධිය සම්පූර්ණ කිරීමට නොහැකි වූ නමුත් ඔවුන් නැවත රාජකාරි ආරම්භ කර තිබුණි. එහෙත්, 2010 පෙබරවාරි 05 දිනැති අංක 920 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය සහ ගිවිසුම් අංක 14(අ) වගන්තියට අනුව, 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ අදාළ කාර්ය මණ්ඩලය වෙනුවෙන් විශ්ව විද්‍යාලය විසින් දරන ලද රු.26,969,765ක වියදම අයකර ගැනීමට සුදුසු පියවර ගෙන නොතිබුණි. | බැඳුම්කර වගකීම් පියවන ලෙසට අදාළ කාර්ය මණ්ඩලයට සහ ඇපකරුවන් වෙත මේ වන විටත් ලිඛිත දැන්වීම් සිදුකර ඇත. එම ගෙවීම් පියවීමට අපොහොසත් වුවහොත් පාලක මණ්ඩලයේ අනුමැතිය මත තනතුර අත්හැර ගියා සේ සලකා කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. | වගකිව යුතු නිලධාරීන්ගෙන් බැඳුම්කර අයකර ගැනීමට නොපමාව පියවර ගත යුතුය. |

## 3.2 ඌන උපයෝජිත අරමුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සිසුන්ගේ අධ්‍යයන සංවර්ධනය හා දිරි ගැන්වීම වෙනුවෙන් පරිත්‍යාග ලෙස එකතුව රු.345,359,916 ක් සුභපතන්නන් විසින් විශ්ව විද්‍යාලය වෙත ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ඉහත අරමුදල් 204 කින් පොලී ලෙස රු. 8,823,834ක් ලැබී තිබුණද, ඉන් රු.6,041,617 ක් හෙවත් සියයට 68 ක් ප්‍රයෝජනයට නොගෙන බැංකු ජංගම ගිණුමක පැවතුණි. | සෑම මාසික මූල්‍ය කමිටුවකදීම හා පාලක මණ්ඩල රැස්වීම්වලදී මෙම පරිත්‍යාග ක්‍රියාකාරම්වල ප්‍රගතිය පිළිබඳව අඛණ්ඩව සාකච්ඡා කරනු ලැබේ. | පරිත්‍යාග උපයෝජනයට සුදුසු ක්‍රියා මාර්ග ගත යුතු ය. |
| (ආ) | දිවංගත කාර්තිගේෂන් දෙමළ සංගීත භාර අරමුදලේ බූදලය හා දිවංගත කාර්තිගේෂන් දෙමළ පුස්තකාල භාර අරමුදලේ බූදලය මගින් 2015 වර්ෂයේදී රු.53,246,276 ක් නිශ්චය කළ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පරිත්‍යාග කර තිබුණි. පරිත්‍යාග කළ වර්ෂයේ සිට රු.184,476,087 ක් පොලී ලෙස ලැබී තිබුණද, ඉන් රු.167,160,640ක් හෙවත් සියයට 91 ක් එම නිශ්චය කළ අරමුණු සඳහා භාවිතා කර නොතිබුණි. | මෙම අරමුදලේ සඳහන් ඇතැම් නිර්නායක ප්‍රායෝගික නොවන බැවින් ඒවා සපුරා ගැනීමට නොහැකි වේ. ඉහත බාධකය නිසා එම අරමුදල භාවිතා කිරීම විශාල අභියෝගයක්වී ඇත. කෙසේ නමුත්, මෙම කාර්තිගේෂන් අරමුදල් කමිටුව විසින් අරමුදල භාවිතා කිරීම පිළිබඳ සාකච්ඡා කර අදාළ නිර්නායක වෙනස් කිරීමට තීරණය කර ඇත. | පරිත්‍යාග උපයෝජනයට සුදුසු ක්‍රියා මාර්ග ගත යුතු ය. |

## 3.3 ව්‍යාපෘති ප්‍රමාද වීම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තු ගත පිරිවැය රු.28,805,000 ක්වූ සුළු නඩත්තු කටයුතු 14 ක් නිම කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාල ඉංජිනේරු ඒකකය වෙත පළමු වාරිකය ලෙස රු.2,591,400 ක් ගෙවා තිබුණි. එහෙත්, 2021 දෙසැම්බර් 31 දින දක්වාම එම නඩත්තු කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි. එමෙන්ම, සමාලෝචිත වර්ෂය තුළ එම ඒකකය විසින් අවසන් කළ යුතු රු. 29,411,000 ක් වූ නඩත්තු කටයුතු 11 ක් නිම නොකිරීමේ ප්‍රතිශතය සියයට 27 ත් සියයට 100 ත් අතර පරාසයක විය. | කොවිඩ් වසංගත තත්ත්වය හා වෙනත් අනපේක්ෂිත තත්ත්වයන් හේතුවෙන් නියමිත වේලාවට වැඩ නිම කිරීමට කොන්ත්‍රාත්කරුට නොහැකි විය. මේ නිසා නඩත්තු ශාඛාව විසින් කළමනාකරණය කළ හැකි එවැනි පුනරුත්ථාපන කටයුතු සඳහා අවශ්‍ය අනුමැතිය උපකුලපතිවරයාගෙන් ලබා ගෙන මූල්‍ය ශාඛාව මගින් අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගනු ලබයි. ප්‍රමුඛතා පදනම සහ පවතින අමුද්‍රව්‍ය ප්‍රමාණය මත වැඩ ආරම්භ කිරීමට කටයුතු කෙරේ. | ඉදි කිරීම් කටයුතු නිසි කළට ආරම්භ කර අවසන් කළ යුතු ය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බේරුම්කරණ ගාස්තු, පොලී සහ පොලී මත පොලී ඇතුළුව රු.මිලියන 93.7 ක් වැයකර කයිතඩි සිද්ධ ආයුර්වේද වෛද්‍ය ඒකකය සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් 2015 වර්ෂයේදී ඉදිකර තිබුණි. 2021 වර්ෂයේ සිදුකළ විගණන පරීක්ෂණයකට අනුව, වර්ෂ 06 ක් වැනි කාලයක් තුළදී තිරස් පිපුරුම්, බොහෝ බිත්ති මත වැසි ජලය කාන්දු වීම්, ඇතුළත බිත්තිවල දිලීර මතු වී තිබීම වැනි ප්‍රමාණවත් දෝෂ හා අසම්පූර්ණ වැඩ නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරු විසින් යම් යම් දෝෂ සහිතව මෙම ගොඩනැගිල්ල 2015 නොවැම්බර් මාසයේදී භාරදී තිබුණි. ඉඩ දුන් කාලය තුළ එම දෝෂ නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වූ අතර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී යම් යම් ගිවිසුම් ගැටළු ඇති විය. අවසානයේදී කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ආරවුල් 05ක් විනිසුරුවරයෙකු වෙත යොමුකර තිබුණි. මහල් 05ක් වූ මෙම ගොඩනැගිල්ලේ තව මහල් 02ක් ඉදි කිරීමට පැවැතිය දී මුදල් අමාත්‍යාංශ විසින් 2021 වර්ෂයේදී ඉදි කිරීම් කාර්යයන් අත්හිටුවීම නිසා මෙම ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු අසම්පූර්ණ තත්ත්වයේ පවතී. | අඩුපාඩු නිවැරදි කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්ව විද්‍යාලයේ පීඨ 10 ක හා අනෙකුත් අධ්‍යයන ඒකකවල මහාචාර්ය, ආශ්‍රිත මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය ආදී ප්‍රධාන අධ්‍යයන තනතුරුවල පුරප්පාඩු 165 ක් සම්පූර්ණ කිරීමට විශ්ව විද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි. | නැවත නැවතත් දැන්වීම් පළකර මහාචාර්ය, ආශ්‍රිත මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ කථිකාචාර්ය වැනි සමහර ප්‍රධාන අධ්‍යයන තනතුරු සම්පූර්ණ කිරීම සඳහා විශ්ව විද්‍යාලය විසින් හැකි සෑම උත්සාහයක්ම ගෙන තිබුණ ද, අවශ්‍ය සුදුසුකම් සහිත අයදුම්පත් ලැබී නොතිබුණි. එවැනි තත්ත්වයක් මත විශ්ව විද්‍යාලය තුළ අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා තාවකාලික කථිකාචාර්යවරුන්, තාවකාලික උපදේශකවරුන් හා තාවකාලික සහායකවරුන් බඳවා ගැනීම මගින් පුරප්පාඩු සම්පූර්ණ කර ඇත. | පුරප්පාඩු පිරවීමට උත්සාහ කළ යුතු වේ. |